මඩකලපුව මහ නගර සභාව
මඩකලපුව දිස්ත්‍රික්කය
-------------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 13 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 07 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මඩකලපුව මහ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2003 වර්ෂයේදී අස්ථානගතවූ රු. 6,860,650 ක් වටිනා වතුර බවුසරය පොත්වලින් කපා හැරීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශනවල වත්කමක් වශයෙන් දිණුම්වලට ගෙනවිත් තිබුණි.

(ආ) මහ නහර සභා පුස්තකාලයේ පොත්වල වටිනාකම තක්සේරුකර ගිණුම්වලට ගෙන තිබුණද පාඨකයන් විසින් ආපසු භාරනොදුන් පොත් 262 ක වටිනාකම වන රු. 38,686 ක් ගිණුම්වලට ගෙන නොතිබූහෙයින් පොත්වල වටිනාකම ශේෂපත්‍රයේ අඩුවෙන් ගණනය කර තිබුණි.

(ඇ) රාජ්‍ය නොවන සංවිධානයකින් පරිත්‍යාගයක් වශයෙන් 2004 වර්ෂයේ ලබා දී තිබූ කායවර්ධන උපකරණවල වටිනාකම තක්සේරුකර ගිණුම්වලට ගෙනවිත් නොතිබුණි.

(ඈ) 1995 වර්ෂයේ සිට සේවකයන්ගෙන් අයකරගෙන තිබූ විශ්‍රාම වැටුප් දායක මුදල මාසිකව ගෙවීමට සභාව විසින් කටයුතු කර නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා රු. 28,454,977 ක දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුව තිබුණි. මෙම මුදල මූල්‍ය ප්‍රකාශනවල පොන්වා නොතිබුණි.

1.3.2 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්
------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සැලසුම් ශිල්පීන්ගෙන් ලබාගත් සේවය වෙනුවෙන් 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය අවසානය දක්වා ඔවුන්වෙත ගෙවියයුතු රු. 422,555 ක මුදල් ගෙවා නිරවුල් කිරීමට ක්‍රියා නොකර තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි.

(ආ) විශ්‍රාම ගිය සහ ස්ථාන මාරුවී ගිය සේවයකින් 11 දෙනෙකුගෙන් අයවියයුතු හිඟ සේවක ණය ශේෂය රු. 465,011 ක මුදල විශ්‍රාම පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර දිගටම මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) පළාත් සභා හා පලාත් පාලන අමාත්‍යාංශයේ 1999 නොවැම්බර් 24 වන දින හා අංක පීඑල්/7/3/4/49 දරණ ලිපිය අනුව 1999 දෙසැම්බර් 01 දින සිට 2007 දෙසැම්බර් 31 දින දක්වා සිනමා හල් ගිමියන් විසින් ගෙවියයුතු විනෝද බදු මුදල පලාත් පාලන කොම්සාරිස්ගෙන් ලබාගතයුතුය. මේ අනුව, පළාත්පාලන කොමසාරිස්ගෙන් අයවියයුතු විනෝද බදු රු. 744,020 ක මුදල මෙතෙක් ලබාගෙන නොතිබුණි.

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 29,634,718 ක පුණරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් වූ අතර එය ඉකුතු වර්ෂය සමඟ සැසදීමේදී පුණරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 20,723,801 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 8,910,917 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

මහ නගර සභාවෙන් ඉදිරිපත් කරනලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම් | තථ්‍ය ආදායම් | සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| දැන්වීම් ගාස්තු | 3,814 | 3,112 | 1,371 |
| ව්‍යාපාර බදු | 8,912 | 6,831 | 3,359 |
| ඝාතනාගාර ගාස්තු | 33 | 27 | 23 |
| බදු කුලී | 6,872 | 6,872 | 6,776 |
| විනෝද බදු | 142 | 89 | 797 |
| නවාතැන් බදු | 185 | 185 | 326 |
| කඩ බදු | 2,222 | 1,888 | 1,088 |
| පොළ බදු | 3,168 | 2,954 | 752 |
| තානායම් ගාස්තු | 468 | - | 1,030 |

#### 2.2.2 දේපල බදු

මහනගර සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ගෙන් 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා අයවියයුතු රු. 19,509,383 ක දේපල බදු මුදල අයකර ගතයුතු වුවද, එය අයකරගෙන නොතිබුණි.

2.2.3 වරිපනම් බදු

--------------

1983 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වෙළඳ ස්ථානවලින් අයවියයුතු හිඟ වරිපනම් බදු රු. 2,296,174 ක් අයවීමට තිබුණද අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.2.4 වෙනත් ආදායම්

-------------------

මහ නගර සභාවට අයත් පොදු ස්ථාන බදු දීමේදී වත්කම් ඇප වශයෙන් ලබා ගැනීම හෝ බැංකු ඇපයක් ලබා ගැනීම හෝ සම්පූර්ණ මුදලම ආරම්භයේදී ලබා ගැනීමකින් තොරව බදු දී තිබීමෙන් 1990 වර්ෂයේ සිට 2014 වර්ෂය අවසානය දක්වා පුද්ගලයින් 61 දෙනෙකුගෙන් අයවියයුතු හිඟ බදු කුලිය රු. 6,776,204 ක් අයකරගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමණාකරණ දුර්වලතා

-----------------------------

වාහන 8 ක මයිලෝ මීටරය ක්‍රියාවිරහිතවී වර්ෂ හයක් ඉක්මවී තිබුනද එය අළුත්වැඩියා කිරීමකින් තොරව දිගටම ප්‍රයෝජනයට ගෙන තිබුණි.

3.2 නිෂ්ක්‍රිය වත්කම්

------------------

සභාව සතු අයත් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත හැකි තත්වයේ තිබුණු ට්‍රක්ටර් 04 ක් සහ බවුසර් 02 ක් අළුත්වැඩියා නොකර වර්ෂ හයකට වඩා වැඩි කාලයක් සිට නිෂ්ක්‍රියව පැවතුණි.

3.3 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

----------------------------------

මහ නගර සභා ආඥා පනතේ අධිකාරය 252 IV කොටසේ අංක 35 ට පටහැනිව වෙළඳ කටයුතු සඳහා ඉතා සුළු මාසික බද්දකට වසර 5 සිට වසර 30 දක්වා දීර්ග කාලයකට මහ නගර සභාවට අයත් ඉඩම් 5 ක් ටෙන්ඩර් පරිපාටිය කිසිවත් අනුගමනය නොකර 2011 සහ 2012 වර්ෂවල සභාපතිවරයා විසින් ලබාදී තිබුණි.

| ඉඩමේ නම | ඉඩමේ ප්‍රමාණය | ඉඩමේ වටිනාකම් රු. | බදු කාලය | මාසික බදු ප්‍රමානය රු. |
|---|---|---|---|---|
| මිනිපෙට්ටි කඩ පිල්ලයාරඩි | පර්චස් 36.69 | මිලියන 2 | වසර 30 | 4,000 |
| ත්‍රිරෝද රථ ගරාජය පිල්ලයාරඩි | පර්චස් 23.72 | මිලියන 2 | වසර 30 | 2,500 |
| පොදු ලිද මුනයි වීදිය | වර්ග අඩි 155.25 | මිලියන 3 | වසර 30 | 1,500 |
| වැව් ඉවුරු ගොඩනැගිල්ල | පර්චස් 16.75 | මිලියන 4 | වසර 05 | 1,000 |
| තර්ෂා එම්පෝරියම් | වර්ග අඩි 568.75 | මිලියන 4 | වාර්ෂිකව | 5,000 |

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

4.1 අයවැය පාලනය

--------------------

අයවැයගත වියදම් සහ තත්‍ය ආදායම් අතර 12% සිට 106% දක්වා විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් රැස්කිරීම

(ආ) අයවැය පාලනය

(ඇ) ස්ථාවර වත්කම් නඩත්තු